# මහාවිහාරයේ භූමිකාව

ඇතැම් ලංකා ඉතිහාසඥයන් (ලංකා විශ්වවිද්‍යාලයෙන් බිහි වූ ඉතිහාසඥයන් යන අරුතින්) මා ඉතිහාසය ගැන කතාකරන විට ඒ සඳහා මට ඇති සුදුසුකම කවරේදැයි අසන බව මම දනිමි. ඒ සඳහා මට ඇති හොඳම සුදුසුකම මා පාසලේ උසස් පෙළ (එවකට ලංකා විශ්ව විද්‍යාල ප්‍රවේශ) පන්තියේ හෝ ලංකා විශ්වවිද්‍යාලයේ හෝ ඉතිහාසය නො හැදෑරීම ය. මා ඉගෙනගත් පාසලේ කණිෂ්ඨ පන්තිය අප සමහර දෙනකුට පූර්ව ජ්‍යෙෂ්ඨය ද විය. අපි ඒ පංතියේ ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව මෙන් ම ඉතිහාසය, සාහිත්‍යය, ලතින් හා පාලි විෂය ද හැදෑරුවෙමු. පාසලක හෝ විශ්වවිද්‍යාලයක හෝ මා ලැබූ හොඳම අධ්‍යාපනය එය විය. මගේ පසුකාලීන ජිවිතය බොහෝ දුරට හැඩගැසුනේ ඒ පංතියේ දී හා ඉන් පසු වසරේ උගත් දෙයින් ය. ඒ ඇතැම් දේ පසුව මම බැහැර කෙළෙමි. එහෙත් එසේ බැහැරකිරීමට මට ශක්තිය ලැබුණේ ද ඒ පංතියේ දී ය. රසායන විද්‍යාව ඉගැන් වූ ගුරුවරයා මහන්සි ගත්තේ විද්‍යාවේ දර්ශනය ගැන අවබෝධයක් ලබාදීමට ය. තමා ද නොදැනුවත් ව වුව ද චක්‍රීය චින්තනය පළමුවරට මගේ සිතට ඇතුල් කෙළේ එතුමා ය. අර්ථදැක්වීම යන්න පැහැදිලිකිරීමට කී එතුමා ඊළඟ මොහොතේ පැහැදිලිකිරීම අර්ථදක්වන්න යැයි කීවේ ය. එතුමාගෙන් මම රසායන විද්‍යාව ඉගෙන නොගත්තෙමි. එහෙත් දර්ශනයත් තනිවම ඉගෙනගැනීමටත් ඉගෙනගත්තෙමි. ඉංගිරිසි සාහිත්‍ය පංතියෙහි ඉගෙනගත් පාර්සීය කතාවක් මුල් කරගත් කාව්‍යයක සොරාබ් හා රස්ටම්, සිංහබාහු හා සිංහයා සමග සම අසම වූයේ කෙසේ ද යන්න පසු කලෙක සිංහබාහු නාට්‍යය නැරඹීමෙන් පසුව ද සිතාගැනීමට නොහැකිවිය. එහෙත් පර්සියාවේ පැරණි ඉතිහාසය හා සංස්කෘතිය ගැන හැදෑරීමෙන් යම් හෝඩුවාවක් ලබාගත හැකිවේ යැයි සිතමි. වීරයා මැරිළා දැයි ඇසීමට පෙර විරයා කවුදැයි ඇසිය යුතු ය. සංස්කෘතියට හා ඉතිහාසයට සාපේක්ෂ නොවන වාස්තවික වීරයෝ නො වෙති. සාමාන්‍ය පෙළ ගණිත ගුරුවරයාගෙන් බල තුනක් සමතුලිත වීමට නම් ඒ අනිවාර්යයෙන් ම ඒකතල විය යුතු බවත් ඒක ලක්‍ෂ්‍ය විය යුතු බවත් එහෙත් ඒ ප්‍රමාණවත් නොවන බවත් දැනගැනීමෙන් මා ලැබූ ආශ්වාදය අවුරුදු පනහකට පමණ පසුව ද මට තවමත් විඳහත හැකි ය. (බටහිර) විද්‍යාව හදාරන සිසුන්ට සාමාන්‍ය පෙළ පරීක්‍ෂණයට ප්‍රජාචාරය විෂයට පෙනී සිටීමට නොහැකි බව දැන දැන ද ගණිතය භෞතික විද්‍යාව ආදී විෂය සමග ඒ විෂය හැදෑරීමට ද අපට පාසලෙන් කාලය වෙන්කර තිබුණි. විභාග අවශ්‍ය වූ නමුත් අපට ලැබුණේ විභාග මූලික අධ්‍යාපනයක් නො වේ. සාමාන්‍ය පෙළ පරීක්‍ෂණයෙන් පසු මා ඉගෙනගත් දෙයින් ඉතා වැඩි ප්‍රමාණයක්, ලංකා විශ්වවිද්‍යාලයේ පළමු වසරින් පසු සියල්ල ම මෙන්, තනිවම පොතපත කියවා ඉගෙනගැනීමට හැකිවීම මගේ භාග්‍යයකි. රසායන විද්‍යාව, පාලි හා ලතින් හැරෙන්නට මම තවමත් අනෙක් විෂය හදාරමි. ඒ මත පදනම් ව දර්ශනය, පුරාවිද්‍යාව හා දේශපාලන විද්‍යාව ද හදාරන්නෙමි. ඊනියා යථාර්ථවාදීන්ට මා සාහිත්‍යය ගැන දරණ අදහස් ද නයාට අඳුකොළ මෙන් බව මම දනිමි. ඔවුන් පවසන්නේ මා මට අයත් නොමැති ක්‍ෂෙත්‍රයකට අත දමන බව ය. එහෙත් මට වැටහෙන කරුණ නම් පැරණි සිංහල සාහිත්‍යය ඊනියා යථාර්ථවාදී, අධියථාර්ථවාදී හෝ වෙනත් බටහිර අච්චුවක හෝ සාහිත්‍යයක් නොවන බව ය. පැරණි සිංහල සාහිත්‍යය එවැනි අච්චුවකට දැමීමට තැත්කළෝ හා කරන්නෝ අනුකාරකයෝ ය.

ලංකාවේ ඉතිහාසය කලාපයේ ඉතිහාසයෙන් වෙන්කර අධ්‍යයනය කළ හැකි නො වේ. ඉතිහාසය යන්න සිදුවන කාලයට මෙන් ම ලියන කාලයට ද සාපේක්ෂ වෙයි. වාස්තවික හා යථාර්ථවාදී ඉතිහාස ඇත්තේ එසේ ඇතැයි කියන්නන්ගේ මනසෙහි ය. මෙරට ඉතිහාසය සකස් වී ඇත්තේ හතරවැනි හා පස්වැනි සියවස්වල ය. මා එයින් අදහස් කරන්නේ ඉන් පෙර ඉතිහාසය මෙන් ම පසු ඉතිහාසය ද ඒ සියවස්වල මූලික වශයෙන් තීරණය වූ බව ය. අවුරුදු එක්දහස් පන්සියයකට පසුව ද අප විකාශය වන්නේ ඒ ඉතිහාසයෙහි ය. එය අමතක කර අපට වර්තමානය පසුකළ හැකි යැයි ඉතිහාසඥයකු හෝ දේශපාලන විද්‍යාඥයකු හෝ දේශපාලනඥයකු හෝ සිතන්නේ නම් ඔහු බටහිර දැනුමෙන් මන්දපෝෂණය වූවකු විය යුතු ය.

දීපවංසය ලියැවී ඇත්තේ හතරවැනි සියවසෙහි යැයි බොහෝ ඉතිහාසඥයෝ සිතති. අපේ දැනට ඇති වංසකතා ඇරඹෙන්නේ ඒ සමගින් ය. දීපවංසය ලියැවී අවුරුදු සියයකින් පමණ ලියැවී ඇතැයි කියන මහාවංසය අපේ ඉතිහාසය එකලට හා අනාගතයට බලපාන පරිදි සකස් කෙළේ ය. මහාවංසය ලියැවී ඇත්තේ ඉතා පැහැදිලිව පස්වැනි සියවසට සාපේක්ෂව ය. එදින සිට, ඉන් පෙරට ද බලපාන පරිදි, සිංහලයන්ගේ ප්‍රධාන කාර්යභාරය වී ඇත්තේ අන් කිසිවක් නොව ථෙරවාදී බුද්දහම රැකීම ය. අපට ඉන් බැහැර වීමට නොහැකි ය. එපමණක් නො වෙයි. අප ඉන් බැහැර

© Prof. Nalin De Silva

වුවහොත් අපේ ස්වෛරීභාවය ද නැතිවෙයි. මහාවංසය ලිවීමෙන් පසු අවුරුදු එක්දහස් පන්සියයක් අපට අභිමානවත් ජාතියක් ලෙස කටයුතුකිරීමට හැකි වී ඇත්තේ අප ඉන් බැහැර නොවුණු බැවිනි, අද ඇතැමුන් අප ඉන් බැහැර කිරීමට උත්සාහ ගන්නේ ඇයි ද යන්න ඒ සමග පැහැදිලි වෙයි.

අපි බ්‍රිතානින්ට යටත් නො වීමු. අපේ නායකයන් කිසි දිනෙක යුද්ධයෙන් පරාජය වී නැතත් ගිවිසුම්වලින් නම් පරාජය වී ඇත. ගිවිසුම් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පදනම් වෙයි. අපට ඒ නුහුරු ය. ගෙරිහම් කඩකින් වසා ගැනීමට හැකි ප්‍රමාණයේ ඉඩම් පෘතුගීසින්ට දීමට එකඟ වීමේ සිට, 1676 ලන්දේසීන් සමග ඇතිකරගත් ගිවිසුම, ඊනියා උඩරට ගිවිසුම හෙවත් සිංහල ඉංගිරිසි ගිවිසුම ආදී ගිවිසුම් ඔස්සේ 1987 ඉන්දු ලංකා ගිවිසුම දක්වා ගිවිසුම්වලින් අපට අත් වී ඇත්තේ පරාජයන් ය. අද ඉන්දියාව සමග අත්සන් කරන විවිධ වෙළෙඳ ගිවිසුම් ද අපට වඩා ඉන්දියාවට හිතකර ය. බටහිරයන් මැදිහත් වී ඇතිකළ ඊනියා සටන් විරාම ගිවිසුම්වලින් අපට සිදු වූ හානිය අති මහත් ය.

මහාවංසය මෙන් ම දීපවංසය ද ඉන්පසු ලියන ලද වංසත්ථප්පකාසිනිය හෙවත් මහාවංස ටීකාව හා අනෙක් වංසකතා ද එක් එක් අය ලියුව ද ඒ සාමූහික ප්‍රයත්න ලෙස සැලකිය හැකි ය. ඒ කෘති නිර්මාණය කිරීමේ දී ජනප්‍රවාද රාශියක් එකතු වී ඇති බව පැහැදිලි ය. දීපවංසය හා මහාවංසය අතර කාලයෙහි ද මහාවංසය හා මහාවංස ටීකාව අතර කාලයෙහි ද ජනප්‍රවාද එකතු වී ඇති අන්දම සලකා බැලීමෙන් අපට බොහෝ දේ ඉගෙනගත හැකි ය. අද මහින්ද චින්තනය ගැන කතාකළ ද තවමත් සිංහල විරෝධී චන්ද්‍රිකා දේශපාලනයක නිරතවන පළාත් සභාවලට ඉඩම් හා පොලිස් බලතල දීමට කැසකවන ඌවේ ඇමතිවරයකුට මා කියන දේ නොතේරෙන්නට ඉඩ ඇත. එහෙත් එළාර රජු දෙමළ (සොළී) වී ඇත්තේ හතරවැනි සියවසින් පසුව බව දීපවංසය හා මහාවංසය සංසන්දනාත්මක ව කියවීමෙන් දැනගත හැකි ය. එහෙත් මේ ඇමතිවරයා දන්නේ පොත් කියවීමට නොව කට කියවීමට ය.

හතරවැනි පස්වැනි සියවස්වල දක්ෂිණ භාරතයේ අපට බල පෑ වැදගත් ම සිදුවීම් දෙක  සිදු වී ඇත. එකක් එහි දෙමළ බලය වර්ධනය වීම ය. දෙවැන්න ආන්ද්‍ර ප්‍රදේශයෙන් ථෙරවාද බුද්ධදහම ක්‍රමයෙන් නැති වී යෑම ය. මේ දෙකම ද්‍රවිඩ දේශයෙහි සිදුවිය. ද්‍රවිඩ යන්නෙහි තේරුම දකුණ යන්න ය. ද්‍රවිඩ ජනයා යනු දකුණේ, එනම් භාරතයේ දකුණේ ජනයා වෙති. භාරතයේ දුර වශයෙන් ගත්කල අපට සමීප ම වැසියෝ ද්‍රවිඩ ජනයා වෙති. එහෙත් අවුරුදු එක්දහස් පන්සියයක පමණ ඇසුරකින් පසුව ද භාරතයේ සංස්කෘතික වශයෙන් ගත්කල අපෙන් වඩාත් ම දුරස්ථ වන්නෝ ඔවුහු ය. එසේ වූයේ ඇයි? අද පවා සිංහලයන්ට කර්ණාටක සංගීතයට වඩා උත්තර භාරතීය සංගීතය ප්‍රියවන්නේ ඇයි? එයට හේතුව ඇතැම් පඬියන්ට අනුව අනගාරික ධර්මපාලතුමා සිංහලයන්ගේ ආර්ය සම්භවයක් ගැන කතා කිරීම ද? එසේ කතාකිරීමෙන් පමණක් සංස්කෘතීන් හැඩගැස්විය හැකිනම් මේ පඬියන් කතාකරන හා ලියන තරමට හා බටහිරයන්ගේ ආධාරයෙන් ඔවුන් උසුලන සංස්කෘතික ආධිපත්‍යය, විශේෂයෙන් ම ජඩමාධ්‍ය ආධිපත්‍යය, හේතුවෙන් සිංහලයන් මේ වනවිට අසිංහලයන් බවට පත් ව සිටිය යුතු ය.

ඉහත සඳහන් සිද්ධි දෙකට ම අපි එකවර මෙන් මුහුණ දුන්නෙමු. එහි දී මහාවිහාරික භික්ෂූන් වහන්සේ මූලිකත්වය ගත් බව නිසැක ය. ද්‍රවිඩ දේශයේ ආන්ද්‍ර ප්‍රදේශයේ බුද්ධදහම තිබූ පමණින් දෙමළ දේශයේ බුද්ධදහම තිබූ බව පෙන්වීමට ඇතැමුන් තැත්කළත් ඒ සඳහා සාධක නොමැත. ආන්ද්‍රය අඩුවෙන් ම ද්‍රවිඩකරණයට ලක් වූ දක්ෂිණ භාරතීය දේශය ලෙස සැලකිය හැකි ය. ලංකාව හා සංස්කෘතික වශයෙන් වඩාත්ම සම්බන්ධ වී ඇත්තේ භාරතයේ වංගය (බෙංගාලය), මධ්‍ය දේශයේ නැගෙනහිරට වූ ප්‍රදේශය, කාලිංගය (ඔරිස්සාව) හා ආන්ද්‍රය වෙයි. ආන්ද්‍ර ප්‍රදේශයෙන් පමණක් නොව භාරතයේ උතුරෙන් ද බුද්ධදහම නැති වී යෑමට මූලික හේතුව මහායාන ව්‍යාප්තිය ය. මහායානය ක්‍රමික විකාශයකින් හින්දු බවට පත්වෙයි. මහාවිහාරය මහායාන හා දෙමළ ව්‍යාප්තිවලට එරෙහිව දැඩිව ක්‍රියා නොකරන්නට අප ද්‍රවිඩ දේශයෙහි කොටසක් වීමට තිබුණි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva